# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සුහුරුපාය, බත්තරමුල්ල

| | | | | | |
|---|---|---|---|---|---|
| තැ.පෙ.අංකය<br>த. பெ.இ<br>Po.Box No | 10120 | | | ෆැක්ස්<br>தொலைநகல<br>Fax | 011-2171635 |
| දුරකථන<br>தொலைபேசி<br>Telephone | 011-2887973<br>(HUNTING) | වෙබ්.ලිපිනය<br>இணையதளம்<br>Web Site | www.Police.lk | ඊ මේල්<br>மின்னஞ்சல்<br>E-mail | dir.media@police.gov.lk |


| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இலக்கம்<br>My NO | 1361/ 2024 | ඔබේ අංකය<br>உமது இலக்கம்<br>Your No | / 2024 | දිනය<br>திக<br>Date | 22/08/2024<br>පැය 2045 |

**මාධ්‍ය නිවේදනය**

## 74 වන බෙල්ලන්විල ඇසල මහා පෙරහර වෙනුවෙන් මාර්ග කිහිපයක රථවාහන ගමනා ගමනය සීමා කිරීම.

### රන් සීවලී පෙරහර - 2024.08.23

බොරලැස්ගමුව පොලිස් වසමේ 74 වන බෙල්ලන්විල ඇසළ මහා පෙරහර 2024.08.23 වන දිනය බොරලැස්ගමුව - බෙල්ලන්තොට මාර්ගයේ විථි සංචාරය කිරීමට නියමිතව ඇත.

මෙම පෙරහර 2024.08.23 වන දින රාත්‍රී 0800 සිට අළුයම 0100 දක්වා කාලය තුල බෙල්ලන්විල විහාරස්ථානයෙන් ආරම්භ වී බෙල්ලන්විල දෙහිවල මාර්ගය ඔස්සේ සෝමරත්න මාවතේ ගමන් කර පැපිලියාන විහාර මාවත ඔස්සේ නැවත විහාරස්ථානය වෙත පැමිණීමට නියමිතය.

ඉහත කාලය තුල බොරලැස්ගමුව - බෙල්ලන්තොට මාර්ගය භාවිතා කරන මහජනතාව සහ රියදුරන්ට පහත විකල්ප මාර්ගයන් භාවිතා කරන ලෙස පොලිසිය ඉල්ලා සිටී.

### විකල්ප මාර්ග

**සියළුම බර වාහන**

- පැපිලියාන දෙසට ගමන් කර අත්තිඩිය මාර්ගය හරහා බෙල්ලන්තොට හංදියට පිවිස ගමන් කිරිම හෝ පිළියන්දල හංදියෙන්, කටුබැද්ද හන්දියෙන් ගාලු පාරට පිවිසිය හැකිය.

**සියළුම සැහැල්ලු වාහන**

- මහරගම හා පිළියන්දල දෙසින් දෙහිවල දෙසට ගමන් ගන්නා සියළුම රථවාහන පැපිලියාන දෙසට ගමන් කර පැපිලියාන හංදියෙන් වමට හැරී අත්තිඩිය මාර්ගය ඔස්සේ බෙල්ලන්තොට හංදියට පැමිණ දෙහිවල දෙසට හෝ ගල්කිස්ස දෙසට ගමන් කිරිම හෝ අබේරත්න මාවත හරහා පිටවැල්ල මාර්ගයෙන් අත්තිඩිය මාර්ගයට පිවිසිය හැක.

### රන්දෝලි පෙරහර - 2024.08.24

මෙම පෙරහර 2024.08.24 වන දිනය රත්මලාන, බෙල්ලන්තොට - අත්තිඩිය මාර්ගයේ හා පැපිලියාන විහාර මාවත ඔස්සේ විථි සංචාරය කිරීමට නියමිතව ඇත.

මෙම පෙරහර 2024.08.24 වන දින රාත්‍රී 0800 සිට අළුයම 0300 දක්වා කාලය තුල බෙල්ලන්විල විහාරස්ථානයෙන් ආරම්භ වී බෙල්ලන්විල දෙහිවල මාර්ගය ඔස්සේ බෙල්ලන්තොට හන්දියට පැමිණ කීල්ස් හන්දිය හරහා අත්තිඩිය මාර්ගය ඔස්සේ පැපිලියාන විහාර මාවතට පිවිස නැවත විහාරස්ථානය වෙත පැමිණීමට නියමිතය.

ඉහත කාලය තුල බොරලැස්ගමුව - නැදිමාල හංදිය මාර්ගය, රත්මලාන, බෙල්ලන්තොට - අත්තිඩිය මාර්ගය හා පැපිලියාන මංසන්ධියේ සිට දෙහිවල මාර්ගය භාවිතා කරන

මහජනතාව සහ රියදුරන්ට පහත විකල්ප මාර්ගයන් භාවිතා කරන ලෙස පොලිසිය ඉල්ලා සිටී.

**විකල්ප මාර්ග**

**සියළුම බර වාහන**

- පැපිලියාන දෙසට ගමන් කර කොහුවල මංසන්ධිය හරහා කළුබෝවිල මාර්ගයෙන් ගාලු පාරට පිවිසිය හැක.

**සියළුම සැහැල්ලු වාහන**

- මහරගම හා පිළියන්දල දෙසින් දෙහිවල දෙසට ගමන් ගන්නා සියළුම රථවාහන පැපිලියාන දෙසට ගමන් කර කොහුවල හංදියෙන් කළුබෝවිල මාර්ගයට ගමන් කිරීම හෝ අබේරත්න මාවතින් අත්තිඩිය මාර්ගයට පිවිස බේකරි හංදිය හරහා ගල්කිස්ස දෙසට පිවිසිය හැක.

**දෙහිවල දෙස සිට පැමිණෙන රථවාහන**

- නැදිමාල හංදියෙන් ඇන්ඩ්‍රසන් පාර හංදියට පිවිස කළුබෝවිල මාර්ගය හරහා ගමන් කල හැක.

මේ සම්බන්ධයෙන් මහජනතාවගේ සහ රියදුරන්ගේ දැන ගැනීම සඳහා ඔබ මාධ්‍ය මගින් ප්‍රචාරයක් ලබාදීමට අවශ්‍ය කටයුතු සිදු කරන මෙන් කාරුණිකව ඉල්ලා සිටිමි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**